කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින තේ කොමසාරිස් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### තේ කොමසාරිස් තනතුර - (HM 1-1)

#### රැකියා පිරිවිතරය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ මගපෙන්වීම් අනුව 1957 අංක 51 දරණ තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පැවරී ඇති අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම හා 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

#### අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ අලෙවි කළමනාකරණය/ ආර්ථික විද්‍යාව/ විද්‍යාව විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් ප්‍රථම විද්‍යා උපාධිය සහ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

ප්‍රථම උපාධි සුදුසුකම ලැබීමෙන් අනතුරුව තේ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 15ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි මධ්‍යම කළමනාකරණය (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

**වැටුප් පරිමාණය :** HM 1-1 02/2016: රු.80,295 - රු.2270 x15 - රු.114,345

කළමනාකරණ චක්‍රලේඛ 02/2016හි ප්‍රතිපාදන අනුව රු.80,295/- ආරම්භක වැටුප මත පිහිටුවා එම වැටුප ද එයට අමතරව මාසිකව රු.12,800/- ජීවන වියදම් දීමනාව ද චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තීය දීමනාව ද ගෙවනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 අනුව ඉන්ධන දීමනාව සහිතව මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන රියදුරෙකු සහිත වාහනයක් අනුයුක්ත කිරීමට හෝ ප්‍රවාහන දීමනාව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**වයස් සීමාව :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

#### වෙනත් ප්‍රතිලාභ

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15%කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3%කින් දායක වනු ඇත.

#### පොදු කොන්දේසි

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතු ය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතු ය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.

#### අයදුම් කිරීම

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2024.02.27 වන දිනට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**සභාපති,**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලුපාර,**
**කොළඹ 03.**

SELACINE